## කාඩ්පත් සාමාජිකයන්ගේ ගිවිසුම

වැදගත් : අමුණා ඇති නේෂන්ස් ට්‍රස්ට් බැංකු කාඩ්පත අත්සන් තැබීමට සහ භාවිතා කිරීමට පෙර කරුණාකර කාඩ්පත් සාමාජිකයින්ගේ ගිවිසුම සැලකිලිමත්ව කියවන්න. කාඩ්පත භාරගැනීම සහ/හෝ අත්සන් කිරීම සහ/හෝ භාවිතා කිරීම මගින් ඔබ පහත දැක්වෙන නියමයන් සහ කොන්දේසින් පිළිගන්නා අතර, ඒවායෙන් බැඳීමට ලක් වේ.

01. **අර්ථ දැක්වීම**

(a) අයදුම්කරු - කාඩ් අයදුම්පත් පෝරමයට අත්සන් තබන ලද ඕනෑම පුද්ගලයකු අදහස් කෙරේ.

(b) බැංකුව - නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී, එහි අනුප්‍රාප්තිකයන් සහ පැවරුම්ලාභින් අදහස් කරේ.

(c) ප්‍රාථමික කාඩ්පත් සාමාජිකයින් - යම් කාඩ්පත් සාමාජිකයකුගේ නමින් බැංකුව විසින් කාඩ්පත් ගිණුමක් ආරම්භ කර ඇති හෝ ආරම්භ කිරීමට තිරණය කරන ලද්දේ නම් එවැනි කාඩ්පත් සාමාජිකයකු අදහස් කරේ.

(d) කාඩ්පත් - බැංකුව විසින් නිකුත් කරන ඇමරිකන් එක්ස්ප්‍රස් ගෝල්ඩ්, ග්‍රීන්, බ්ලූ හෝ ඇමරිකන් එක්ස්ප්‍රස් වර්ගයේ වෙනත් ඕනෑම කාඩ්පතක් අදහස් කෙරේ.

(e) කාඩ්පත් ගිණුම - මෙම ගිවිසුම යටතේ ප්‍රාථමික කාඩ්පත් සාමාජිකයකු ලෙස අතිරේක කාඩ්පත් හිමියකු/යන් වෙතොත් ඔවුන් විසින් ලබාගන්නා හෝ වැයකරන්නා වූ සියලුම හර බැර ඇතුලත් කිරීමේ අරමුණින් බැංකුව විසින් විවෘත කරන කාඩ්පත් ගිණුම අදහස් කෙරේ.

(f) මුල්‍ය ණය - කාඩ්පත, කාඩ්පත් අංකය හෝ රහස්‍ය අංකය භාවිතා කරමින් මුදල් ලබාගැනීමේ ක්‍රියාව අදහස් කෙරේ.

(g) මුල්‍ය ණය සීමාව - මුල්‍ය ණය සඳහා බැංකුව විසින් අනුමත කරන උපරිම සීමාව අදහස් කෙරේ.

(h) කාඩ්පත් සාමාජිකයා - බැංකුව විසින් කාඩ්පතක් නිකුත් කරන ලබන අයදුම්කරුවකු අදහස් කෙරේ.

(i) අය කිරීම හෝ ගණුදෙනුව - මෙම ගිවිසුම යටතේ අයකර ගන්නා ලද අදල ගාස්තුද ඇතුලත්ව කාඩ්පත් මගින් කරනු ලබන අයකිරීමක් සහ කාඩ්පත් සාමාජිකයා එකග වන පරිදි බැංකුවට ගෙවීමට එකගව ඇති හෝ වගකීමට බැදීමට එකගවන පරිදි බැංකුවට ගෙවීමට එකගව ඇති හෝ එකගවන කාඩ්පත් සාමාජිකයා වගකීමකට බැදීමට එකග වන ලද මුළු මුදල් ප්‍රමාණය වේ.

(j) මුල්‍ය සීමාව - කාඩ්පත් ගිණුම යටතේ බැංකුව විසින් අනුමත කරන උපරිම හර ශේෂය අදහස් කෙරේ.

(k) ජංගම ශේෂය - කාඩ්පත් ගිණුමෙහි යම් දිනකට වන සම්පූර්ණ හිග හිටුවා ඇති මුදල් ප්‍රමාණය අදහස් කෙරේ.

(l) ගෙවිය යුතු අවම මුදල - ගෙවිය යුතු දිනට ගෙවිය යුතු අවම මුදල වශයෙන් ගිණුම් ප්‍රකාශයේ සදහන් වන මුදල වේ.

(m) එතෙර ගණුදෙනු - විදේශයකදී සිදුකරන ලද ගණුදෙනු අදහස් කෙරේ.

(n) අතීතයේ ගෙවිය යුතුව තිබූ මුදල්- පූර්ව ගිණුම් ප්‍රකාශන වල ගෙවිය යුතු අවම මුදලනේ හිග හිටවා ඇති සමුච්චිත මුදලක් වෙතොත් එය වේ. අතීතයේ ගෙවීය යුතුව තිබූ මුදල් ගිණුම් ප්‍රකාශයේ වෙනම දක්වා ඇති අතර ඒවා වහාම ගෙවිය යුතු වේ.

(o) ගෙවීම කළ යුතු දිනය - සම්පූර්ණ හිග හිටවා ඇති මුදල හෝ ඉන් කොටසක් හෝ ගෙවිය යුතු අවම මුදල යම් දිනකට බැංකුවට ගෙවිය යුතු යැයි ගිණුම් ප්‍රකාශයේ දක්වා ඇත්ද එම දිනය අදහස් කෙරේ.

(p) රහස්‍ය අංක (PIN) - ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර (ATM) මගින් කාඩ්පත භාවිතා කිරීම සදහා සාමාජිකයන්ට බැංකුව විසින් ලබාදෙනු ලබන හෝ කාඩ්පත් හිමියා විසින්ම තෝරා ගන්නා පෞද්ගලික අනන්‍යතා අංකය අදහස් කෙරේ.

(q) පසු දිනය - කාඩ්පත් සාමාජිකයාගේ අංකයට ගණුදෙනුවක් සකස් කර පැවරෙන දිනය අදහස් කෙරේ.

(r) සේවා ආයතන - භාණ්ඩ හා සේවා මිලදී ගැනීමේදී කාඩ්පත් පිළිගනු ලබන හෝ ගෙවුම් උපකරණයක් වශයෙන් කාඩ්පත පිළිගැනීමට කැමති කුමන ස්ථානයක හෝ පිහිටා ඇති සේවා ස්ථානයක් අදහස් කෙරේ.

(s) ප්‍රකාශනය - කාඩ්පත් ගිණුම සම්බන්ධයෙන් ප්‍රාථමික කාඩ්පත් සාමාජිකයකු/යන්ගේ අදාල දිනට වන මූල්‍යමය වගකීම දක්වමින් බැංකුව විසින් කාඩ්පත් සාමාජිකයකුට යවනු ලබන මාසික ගිණුම් ප්‍රකාශය අදහස් කෙරේ.

(t) අතිරේක කාඩ්පත් සාමාජිකයා - ප්‍රාථමික කාඩ්පත් සාමාජිකයාගේ ඉල්ලීම මත කාඩ්පතක් නිකුත් කරනු ලැබූ, ප්‍රාථමික කාඩ්පත් හිමියන්ගේ ගිණුමෙන් අදල තැනැත්තාගේ අයවීම් අයකර ගත හැකි ප්‍රාථමික කාඩ්පත් හිමියකු නොවන වෙනත් තැනැත්තකු වේ.

(u) තෙවන පාර්ශවීය සැපයුම්කරු - කාඩ්පත මගින් පුළුල් ප්‍රතිලාභ සහ/හෝ සේවාවන් ලබාදීම සඳහා බැංකුව විසින් සම්බන්ධීකරණය කරන ලබන තෙවන පාර්ශවයන් අදහස් කෙරේ.

(v) ගෙවිය යුතු සම්පූර්ණ අවම මුදල - ගෙවිය යුතු අවම මුදල සහ අතීතියේ ගෙවිය යුතුව තිබූ මුදලේ එකතුව අදහස් කෙරේ. මෙය ගිණුම් ප්‍රකාශයේ වෙනම දක්වා තිබේ.

(w) සම්පූර්ණ හිඟ හිටවා ඇති මුදල - බැංකු වාර්තාවලට අනුව ගිණුම් ප්‍රකාශය නිකුත් කරන දිනට කාඩ්පත් ගිණුම යටතේ බැංකුවට ගෙවිය යුතු සම්පූර්ණ හර ශේෂය (කාඩ්පත් ගිණුමට හරකල හැකි සියලූ වියදම්ද ඇතුලුව) අදහස් කෙරේ.

(x) ගණුදෙනුව සිදුවූ දිනය - කාඩ්පත් සාමාජිකයකු සහ සේවා ආයතනයක් අතර ගණුදෙනුවක් සිදුවූ දිනය අදහස් කෙරේ.

02. <u>නියමයන් හා කොන්දේසින්හි අදාලත්වය සහ ව්‍යවස්ථාවලට අනුකූල වීම.</u>

2.1 කාඩ්පත් හෝ කාඩ්පත් ගිණුම යටතේ යම් පුද්ගලයකුට බැංකුව විසින් ලබාදී ඇති සියලුම පහසුකම් මෙම ගිවිසුමේ දක්වා ඇති නියමයන් සහ කොන්දේසීන්ට සහ කලින් කලට බලපවත්වනු ලබන වෙනත් ඕනෑම වැඩ සටහනක් යටතේ වන නියමයන්ට සහ කොන්දේසින්ට යටත් වන අතර, ඒ බවට කාඩ්පත් හිමියා විසින් කාඩ් අයදුම්පත් පෝරමයට ඔහුගේ හෝ ඇයගේ අත්සන තබා පිළිගැනීම සහ/හෝ කාඩ්පත් මත

ඔහුගේ/ඇයගේ අත්සන තැබීම හෝ කාඩ්පත භාවිතා කිරීම මගින් ප්‍රත්‍යක්ෂ සාක්ෂියක් වේ.

2.2 කාඩ්පත භාවිතය ශ්‍රී ලංකාවේ අදාල වන නීතින්ට සහ අදාල විනිමය පාලන රෙගුලාසින්ට සහ කලින් කලට සංශෝධනය වන ප්‍රතිපත්ති සහ රෙගුලාසින්ට දැඩිලෙස අනුකූල විය යුතුය.

2.3 කාඩ්පත් සාමාජිකයින් විසින් වාණිජ්‍යය ප්‍රමාණයන්ගේ හෝ ප්‍රාග්ධන ගණුදෙනු සඳහා වන මිලදී ගැනීම් වලට සහ/හෝ ආනයනය කිරීම් සඳහා කාඩ්පත භාවිතා නොකළ යුතුය.

2.4 විදේශ විනිමය ඉලෙක්ට්‍රොනික් හුවමාරු (EFT) හෝ ATM යන්ත්‍ර මගින් ආපසු ගැනීම සඳහා කාඩ්පත් භාවිතා කිරීම අවශ්‍ය වන අවස්ථාවක අදාල ගණුදෙනු විනිමය පාලන දෙපාර්තමේන්තුව මගින් කලින් කලට නිකුත් කරන ලද රෙගුලාසින්ට යටත්වන අතර, ඒවා බලය ලබාදුන් අරමුණු සඳහා පමණක් භාවිතා කළ හැක.

2.5 බැංකුව විනිමය පාලක හෝ වෙනත් පාලන අධිකාරියක් මගින් කලින් කලට නියම කරනු ලබන අවශ්‍යතාවලට අනුකූල වන අතර අදාල ගණුදෙනු පිලිබඳව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ අදාල අධිකාරින්ට ලංකාවේ බලපවත්නා නීතින් සහ ප්‍රතිපාදයන් යටතේ කරුණු අනාවරණය කරනු ඇත.

2.6 විනිමය පාලන රෙගුලාසින් හෝ වෙනත් ව්‍යවස්ථාපිත රෙගුලාසින් උල්ලංඝනය කරනු ලැබ ඇති බවට විශ්වාසය තැබිය හැකි කිසිදු ආකාරයේ යම් හේතුවක් බැංකුව සතු වන විට බැංකුවට සිය අභිමතය පරිදි කාඩ්පත් සාමාජිකයන්ට දැනුම්දීමකින් තොරව කාඩ්පත් අවලංගු කළ හැකිය.

03. <u>කාඩ්පත් සේවාවන්</u>

කාඩ්පත් අන් අයකුට පැවරිය නොහැකි අතර, එය භාවිතා කිරීම මෙම ගිවිසුමේ හා බැංකුව විසින් කලින් කලට නියම කරනු ලබන වෙනත් නියමයන්ට යටත් වේ. කාඩ්පත් ලද වහාම කාඩ්පත් සාමාජිකයා විසින් කාඩ්පතෙහි අනිත් පස අත්සන් තැබිය යුතු අතර, කාඩ්පත මත තබන අත්සන අයදුම්පත් පෝරමයේ සඳහන් වන අත්සනට සමාන විය යුතුය.

04. <u>කාඩ්පත භාරදීම.</u>

කාඩ්පත කුරියර් කිරීම, ලියාපදිංචි තැපැල් මගින් යැවීම හෝ කාඩ්පත් සාමාජිකයන්, අතිරේක කාඩ්පත් සාමාජිකයන් හෝ බලයලත් තෙවන පාර්ශවයක් විසින් බැංකු කවුන්ටරයට පැමිණ ලබාගැනීම කළ හැක. ප්‍රාථමික කාඩ්පත් සාමාජිකයකු හෝ අතිරේක කාඩ්පත් සාමාජිකයකු විසින්

කාඩ්පත ලද පසු ඔහු හෝ ඇය සිය අනන්‍යතාවය ඉදිරිපත් කල යුතු අතර, දැනුම්දීමේ පත්‍රිකාව යථාපරිදි අත්සන් කිරීම මගින් කාඩ්පත ලද බව වහාම දැනුම්දිය යුතුය. කාඩ්පත් සාමාජිකයකු ඔහුගේ හෝ ඇයගේ අභිමතය පරිදි ඔහු හෝ ඇය වෙනුවෙන් කාඩ්පත් භාරගැනීම හෝ එකතු කිරීම සඳහා තෙවන පාර්ශවයකට ලිඛිතව බලය පැවරිය හැකි අතර, කාඩ්පත් සාමාජිකයා හෝ ඔහු හෝ ඇය වෙනුවෙන් එය භාරගැනීමට බලයලත් තැනැත්තා කාඩ්පත භාරගන්නා අවස්ථාවේදී කාඩ්පත් වෙනුවෙන් දරන ලද සියලු වියදම් ගෙවීමට බැඳී සිටී. බැංකුව විසින් සිය අභිමතය පරිදි බැංකුව විසින්ම තීරණය කරනු ලබන කාඩ්පත් සාමාජිකයාගේ නියෝජිකයෙක් වන තෙවන පාර්ශවයකට හෝ නියෝජිතයකුට කාඩ්පත භාරදිය හැක. එලෙස කාඩ්පත භාරදෙන අවස්ථාවේදී කාඩ්පත මත වන වියදම් දැරීමට කාඩ්පත් සාමාජිකයා බැඳී සිටී.

## 05. <u>කාඩ්පත භාවිතා කිරීම</u>

**5.1** කාඩ්පත සර්වභෞමිකව වලංගු වේ. කෙසේ වුවද, කිසියම් හේතුවක් මත යම් කිසි සේවා සැපයුම් ආයතනයකදී කාඩ්පත භාවිතා කිරීම ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය බැංකුව සහ අදාල සේවා සැපයුම් ආයතන රඳවා තබාගනී. කාඩ්පත භාවිතා කල හැක්කේ සද්භාවී, පෞද්ගලික හෝ කාර්යාලීය අරමුණු සඳහා පමණක් වන අතර, කාඩ්පත් සාමාජිකයාගේ ව්‍යාපාරික කටයුතු වලදී වාණිජ්‍ය පරමාර්ථයන් උදෙසා කාඩ්පත අයුතු ලෙස ප්‍රයෝජනයට ගත නොහැක. සමහර සේවා සැපයුම් අයතන වලදී දරන ලද වියදම් මිලදී ගැනීම් හෝ වෙනත් පහසුකම් ලබාගැනීම සඳහා වන අයකිරීම්ද ඇතුලත් විය හැකි බවට පැහැදිලි කෙරේ.

**5.2** කාඩ්පත් සාමාජිකයා විසින් සෑම විටම ඔහුගේ රහස්‍ය අංකය රහසිගතව සහ වෙන් වශයෙන් තබාගත යුතු අතර, කාඩ්පත ආරක්ෂිත ස්ථානයක තබා ගැනීමට සහ වෙනත් පුද්ගලයකු විසින් භාවිතා නොකරන බවට සහතික විය යුතුය. කාඩ්පත් සාමාජිකයාගේ දැනුම ඇතිව හෝ නැතුව රහස්‍ය අංකය භාවිතා කරමින් කරන සියලු ගණුදෙනු වල වගකීම කාඩ්පත් සාමාජිකයා දැරිය යුතුය.

**5.3** කාඩ්පත සේවා ආයතනයකදී භාවිතා කරන අවස්ථාවකදී කාඩ්පත් සාමාජිකයා විසින් අයකිරීම් පත්‍රිකාව අත්සන් කිරීමෙන් පසුව එහි පිටපතක් ලබාගත යුතුය. සාමාන්‍යයෙන් බැංකුව විසින් වෙනත් අයකිරීම් පත්‍රිකා වල පිටපත් කාඩ්පත් සාමාජිකයාට ලබානොදේ. කෙසේ වුවද, බැංකුවේ පූර්ණ අභිමතය පරිදි බැංකුව විසින් තීරණය කරන අතිරේක ගාස්තු ගෙවීමෙන් පිටපත් ලබාදෙනු ඇත.

**5.4** බැංකුව වසින් තෝරා ගනු ලැබූ විද්‍යුත් තැපැල් මගින් ඇණවුම් කරන හෝ දුරකථන මගින් ඇණවුම් කරන හෝ අන්තර්ජාල භාවිතය මගින් කරන ඇතැම් ගනුදෙනු සිදුකිරීමේ පහසුකම කාඩ්පත් සාමාජිකයන්ට ලැබෙන බව කාඩ්පත් සාමාජිකයා පිළිගන්නා අතර, එවැනි අවස්ථාවලදී කාඩ්පත භාවිතා කිරීමේදී කාඩ්පත් සාමාජිකයා විසින් අයකිරීම්

පත්‍රිකාව අත්සන් නොකරනු ඇත. එවැනි මිලදීගැනීමක් හෝ අයකිරීමක නිර්ව්‍යාජත්වය හෝ වලංගු භාවය පිළබඳව ආරවුලක් ඇති විටකදී පවා අදළ හිග මුදල ගෙවීමට කාඩ්පත් සාමාජිකයා එකග වේ. එවැනි ආරවුලක් කාඩ්පත් සාමාජිකයා සහ අදල සේවා සැපයුම්කරු අතර වන කාරණයක් වන අතර, සාමාජිකයා සහ අදළ සේවා සැපයුම් ආයතනය විසින් නිරාකරණය කර ගනු ලැබිය යුතු කාරණයක් වේ. ඒ සම්බන්ධයෙන් කිසිම ආකාරයකට බැංකුව වගකියනු නොලැබේ.

5.5 කාඩ්පත් බැංකුව විසින් කාඩ්පත් හිමියාට දනුම්දෙනු ලබන මුල්‍ය සීමාවන් තුළ මුහුණතෙහි දක්වා ඇති මාසයේ අවසාන දින හෝ එයට පෙර පමණක් කාඩ්පත භාවිත කළ යුතු වේ.

5.6 කාඩ්පත් හිමියා විසින් බැංකුවට ලිඛිතව දනුම්දෙන කාලයක් සඳහා කාඩ්පත් අලුත් කිරීම සහ/හෝ නැවත කාඩ්පත් ලබාදීමට බැංකුවට පූර්ණ අභිමතයක් ඇති බවට කාඩ්පත් හිමියා එකග වේ. කාඩ්පත් කල් ඉකුත්වීමේදී, නැතිවීමෙදී, හානිවීමෙදී, සොරකම්කරනු ලැබ ඇති විටක නැවත අලුත් කිරීම හෝ ලබාදීමේ පූර්ණ අයිතිය බැංකුව විසින් රඳවා තබාගනී. කාඩ්පත නැවත අලුත් නොකරන අවස්ථාවක කිසිදු ප්‍රමාදයකින් තොරව සම්පූර්ණ හිග මුදල් කාඩ්පත් සාමාජිකයා විසින් බැංකුවට ඉතා ඉක්මනින් ගෙවිය යුතු වේ.

5.7 කාඩ්පත හිමියා කාඩ්පත සමග සම්බන්ධ වන සියලුම ගණුදෙනු වලදී බැංකුව සමග උපරිම විශ්වාසයෙන් කටයුතු කිරීමට ප්‍රතිඥා දේ.

5.8 කිසිදු හේතු දක්වීමකින් තොරව මුල්‍ය සීමාව අත්හිටුවීමේ හෝ අඩු කිරීමේ සහ කාඩ්පත මත වන යම් විශේෂ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ අභිමතය සහ නිදහස බැංකුව විසින් රඳවා තබාගනී. බැංකුව එවැනි මුල්‍ය සීමාව අත්හිටුවීම හෝ අඩු කිරීම නිසා කාඩ්පත් සාමාජිකයන්ට උද්ගතවිය හැකි යම් පාඩු හා අලාභ සම්බන්ධයෙන් වගකීමක් නැත.

## 06. <u>ගිවිසුම උල්ලංඝනය කිරීම</u>

කාඩ්පත් සාමාජිකයකු විසින් මෙම ගිවිසුම උල්ලංඝනය කරනු ලැබූ අවස්ථාවක,

(අ) මෙම ගිවිසුමේ දක්වා ඇති ප්‍රතිපාදනයන්ට අමතරව එවැනි උල්ලංඝනය කිරීමක් නිසා බැංකුවට ඍජුව හෝ වක්‍රව සිදුවන යම් පාඩුවක් හෝ වෙතොත් එය කාඩ්පත් සාමාජිකයා විසින් ප්‍රතිපූරණය කළ යුතුය.

(ආ) කාඩ්පත් සාමාජිකයාගෙන් බැංකුවට අයවිය යුතු සම්පූර්ණ හිග මුදල ගෙවන ලෙසට විධාන කළ විටක එසේ විධාන කළ දිනට අයවිය යුතුව හා ගෙවිය යුතුව ඇති මුදල ගෙවීමට කාඩ්පත් සාමාජිකයා වගකීමට බැඳේ.

## 07. <u>කාඩ් පහසුකම් අත්හිටුවීම</u>

7.1 කාඩ්පත් සාමාජිකයාට ඕනෑම අවස්ථාවකදී කාඩ්පත් පහසුකම අවසන් ලෙසට බැංකුවට කරන ලිඛිත දැන්වීමක් මගින් ඉල්ලා සිටිය හැක. එහිදී ප්‍රාථමික කාඩ්පතෙහි සහ අතිරේක කාඩ්පත නැවත භාරදිය යුතුය.

7.2 කාඩ්පතෙහි චුම්භක කොටස කැපී යන පරිද්දෙන් කොටස් 4කට කපා, එකී කොටස් බැංකුව වෙත ලද බව තහවුරු කරනු තෙක් එවැනි දැනුම්දීමක් වලංගු වන්නේ නැත.

7.3 ඉහත දක්වූ ආකාරය හැර කාඩ්පත් සාමාජිකයකුට කාඩ්පත හෝ කාඩ්පත් ගිණුම අවසන් කළ නොහැක.

7.4 කාඩ්පත විනාශ කිරීමෙන් පසුව කාඩ්පත මත යම් ගෙවීමක් සිදුකරනු ලැබූ විට එය අයථා භාවිතයේ ප්‍රතිඵලයක් ලෙස සිදුවූවද නොවූවද, හෝ බැංකුවට දැනුම්දීමක් කර තිබුණද නොතිබුණද එවැනි ගෙවීම් සඳහා කාඩ්පත් සාමාජිකයා සම්පූර්ණ වගකීමට බැඳේ. බැංකුව විසින් ඕනෑම අවස්ථාවක දැනුම්දීමක් සහිතව හෝ රහිතව අවස්ථානුගත තත්ත්වයන් මත බැංකුවේ අභිමතය පරිදි කාඩ්පත අවසන් කළ හැකිය.

7.5 කාඩ්පත අවසාන කිරීමේදී බැංකුව සහ කාඩ්පත් සාමාජිකයා අතර වූ මෙයට පැටහැණි කිසියම් පූර්ව එකගතාවයක් තිබුණද,

(අ) කාඩ්පත භාවිතා කිරීමට කාඩ්පත් සාමාජිකයාට ඇති අයිතිය ඉක්මනින් නැතිවනු ඇත.

(ආ) ගිණුම් ප්‍රකාශයෙහි දැනටමත් පිළිඹිබු වූවද, නොවූවද ඒ වනවිට හිගව ඇති සම්පූර්ණ මුදල මෙන්ම අවසන් කිරීමෙන් පසුව සිදුකරන ලද වෙනත් ගෙවීම් සහ කාඩ්පත් අවසන් කිරීමෙන් පසුව කරන ලද වියදම්ද (අදාළ ගණුදෙනු සිදුවූ දින සිට බලපැවැත්වෙන පරිදි) සහ ඒ මත අදාළ වන පොලියද, කාඩ්පත් සාමාජිකයා විසින් ගෙවිය යුතුය.

7.6 කාඩ්පත් ගිණුමේ හිග හිටුවා ඇති සම්පූර්ණ ශේෂය සහ කාඩ්පත් ගණුදෙනු මත හිග හිටුවා ඇති නමුත් ඒ වන විට කාඩ්පත් ගිණුමට අයකර ගෙන නොමැති මුදල් මෙම ගිවිසුම අවසන් විමෙන් හෝ කාඩ්පත් සාමාජිකයා බුන්වත්භාවයට පත්වීමෙන් හෝ මියයාමෙන් ඉතා ඉක්මනින් අයවිය යුතුව සහ ගෙවිය යුතුව බවට පත්වේ. කාඩ්පත් සාමාජිකයා හෝ ඔහුගේ දේපල කාඩ්පත් ගිණුමෙහි වන එවැනි හිග මුදල් ගෙවීම සම්බන්ධයෙන් වගකීමට යටත් වන අතර, එවැනි හිග මුදලක් නැවත අයකර ගැනීමේදී

දරන්නට සිදුවූ සියලු වියදම් සහ ගාස්තු (නීති ගාස්තුද ඇතුළත්ව) බැංකුවට ප්‍රතිපූරණය කළ යුතු වේ. එවැනි නැවත ගෙවීමක් පවතින අතරතුරදී මූල්‍යමය වියදම් සහ ගාස්තු තත්කාලීනව බලපවත්නා අනුපාතයන්ට යටත්ව ඉදිරියට අයකරගැනීමට බැංකුවට හිමිකම් ලැබේ.

7.7 මෙම ගිවිසුම කුමන පාර්ශවයක් විසින් හෝ අවසන් කිරීම සිදුකළද කාඩ්පත් සාමාජිකයා විසින් කාඩ්පත භාවිතය මගින් සිදුකරන වෙනත් වියදම් ගෙවීමට තවදුරටත් වගකීමට බැදේ.

## 08. විදේශයකදී කාඩ්පත භාවිතය

කාඩ්පත ජාත්‍යන්තර සේවා සැපයුම් ආයතනවලදී වලංගු වන අතර, එහි භාවිතය ශ්‍රී ලංකා මහ බැංකුවේ (CBSL) නිර්දේශයන් මගින් දක්වා ඇති සීමාවන් ඉක්මවා ගිය හොත් එවැනි විටක CBSL හි අවසරය ලබාගැනීමට කාඩ්පත් සාමාජිකයා ප්‍රතිඥා දේ. කෙසේ වුවද කිසිදු අවස්ථාක් යටතේ වැඩිදුර මුදල් ලබාගැනීමේ පදනම මත පිහිටා නැවත ගෙවීම ප්‍රමාද කිරීම හෝ ප්‍රතික්ෂේප කිරීම නොකළ යුතුය.

## 09. විදේශයක කටයුතු කාඩ්පත් සාමාජිකයන්

පූර්ණකාලීන සේවානියුක්තිකයකු වශයෙන් විදේශගත වන හෝ ක්‍රියාකරන විනිමය පාලන රෙගුලාසින් යටතේ අනේවාසික පුරවැසියකු වශයෙන් සලකනු ලබන කාඩ්පත් හිමියකු ඒ බැව් බැංකුවට ලිඛිතව දැනුම්දිය යුතු අතර, බිල් කරන ලද සහ නොකරන ලද ගෙවීම්ද සමග ප්‍රාථමික කාඩ්පත සහ අතිරේකව වන කාඩ්පත්ද බැංකුවට භාරදිය යුතුය.

## 10. ශ්‍රී ලංකාවේ පුරවැසියන් නොවන අයට කාඩ්පත් (NRSL)

CBSL මගින් නිකුත් කර ඇති දැනට බලපවත්නා නිර්දේශයන් මත NRSL හට කාඩ්පත් භාවිතා කළ නොහැක. එවැනි අවස්ථාවක කාඩ්පත් හිමියා ප්‍රාථමික කාඩ්පත සහ අතිරේක කාඩ්පත බැංකුවට ආපසු ලබාදිය යුතුය.

## 11. විදේශීය ජාතිකයන් සඳහා කාඩ්පත්

විදේශ ජාතික කාඩ්පත් සාමාජිකයකු ඔහු/ඇය ලංකාවේ පදිංචිව සිටිනම් කාඩ්පත භාවිතා කළ හැක. එවැනි විදේශ ජාතික කාඩ්පත් සාමාජිකයකු විසින් ඔහු හෝ ඇය ස්ථිර වශයෙන් රට හැර යන්නේ නම් සහ/හෝ ඔහුගේ හෝ ඇයගේ නේවාසික වීසා අවසන් වීමට මාසයකට පෙර ඒ බව බැංකුවට ලිඛිතව දැනුම්දිය යුතුය. ඔහු/ඇය බිල්කරන ලද හෝ නොකරන ලද වියදම් සම්පූර්ණයෙන් පියවිය

යුතු අතර ඉහත දක්වූ අවස්ථාවන්හි එකක් හෝ සිදුවීමට පෙර සිය කාඩ්පත බැංකුවට පවරාදිය යුතුය.

12. **<u>විදේශ විනිමය මගින් කරනු ලබන වියදම්.</u>**

ශ්‍රී ලංකා රුපියල් වලින් නොවන වෙනත් විදේශ විනිමය මගින් කරනු ලබන ගණුදෙනු බැංකුව විසින් තීරණය කරන හුවමාරු අනුපාතිකයක් යටතේ ශ්‍රී ලංකා මුදලට පරිවර්තනය කිරීමෙන් අනතුරුව ගිණුමට බැර වනු ඇත.

(1) ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් වලින් නොවන වෙනත් විදේශ විනිමයක් මගින් කරනු ලබන ගෙවීමක් ඇමරිකන් එක්ස්ප්‍රස් මගින් පරිවර්තනය කිරීමේදී බිල්ගත කරන විනිමයට පරිවර්තනය කිරීමට පෙර ඇමරිකානු එක්සත් ජනපද ඩොලර් වලට පරිවර්තනය කෙරේ. ඇමරිකන් එක්ප්‍රස් විදේශ ගෙවීම් සඳහා පරිවර්තනය ගෙවීමේදී 1.5% පරිවර්තිත ගාස්තුවක් පරිවර්තිත මුදලට එකතු කරනු ලැබේ. බැංකුව විසින් සියලු එතෙර ගණුදෙනු තත්කාලීනව පත්වාගෙන යනු ලබන විනිමය අනුපාතිකයන්ට අනුව බිල්කරන මුදලට පරිවර්තනය කෙරේ.

13. **<u>මුල්‍ය ණය</u>**

13.1 කාඩ්පත් සාමාජිකයා විසින් ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර (ATMs) හෝ බැංකු ශාඛා හෝ මුදල් ලබාදෙන වෙළඳුන් හෝ නියෝජිතයන්ගෙන් ලබාගන්නා මුල්‍ය ණය (ATMs) බැංකු දේශිය හෝ ප්‍රාදේශි සීමාවන්නට යටත් වේ. මහ බැංකුවේ සහ විනිමය පාලන දෙපාර්තමේන්තුවේ රෙගුලාසින්ද අදාළ වේ. කාඩ්පත් සාමාජිකයන්ට ATMs මගින් බැංකුව විසින් නිකුත් කරන ඇති සිය රහස්‍ය අංගය භාවිතා කරන්නේ නම් මිස මුදල් ලබාගත නොහැක.

13.2 කාඩ්පත් සාමාජිකයන්ට මුදල් අත්තිකාරම් ලබාගත හැක්කේ මුදල් අත්තිකාරම් සීමාවන් දක්වා පමණී. තාවකාලිකව ණයසීමාව වැඩිකිරීම් සහ/හෝ මුදල් තැන්පතු කිරීම් හෝ කාඩ්ගිණුම් වලට මුදල් පැවරීම් මුල්‍ය ණය සීමාව කිසිවිටක වැඩි කරන්නේ නැත.

13.3 මෙකී පහසුකම් කාඩ්පත් හිමියාට පූර්ව දැනුම්දීමකින් තොරව බැංකුව විසින් වෙනස් කරනු ලැබිය හැකි හෝ ආපසු ගනු ලැබිය හැකිය.

14. **<u>මුල්‍ය සීමාවන්</u>**

කාඩ්පත සමග වන ආවරණ ලිපියෙහි මෙන්ම ගිණුම් ප්‍රකාශයෙහිද, කාඩ්පත් සාමාජිකයාගේ ගිණුමට අදාළ වන මූලික මුල්‍ය ණය සීමාව පෙන්නුම් කෙරේ. බැංකුව විසින් මුල්‍ය සීමාව තීරණය

කර ඒ බව කාඩ්පත් සාමාජිකයාට කලින් කලට දැනුම්දෙනු ඇත. වර්තමාන ශේෂය මුල්‍ය සීමාව ඉක්මවා යන්නේ නම් කාඩ්පත් සාමාජිකයා එවැනි අතිරික්ත මුදල් කඩිනමින් ගෙවිය යුතුය. සීමාව ඉක්මවා තිබුණහොත් කලින් කලට සීමාව ඉක්මවීම මත වන දඩයක් කාඩ් ගිණුමෙන් අයකරගනු ඇත.

15. **<u>කාඩ්පත් කල්ඉකුත්වීම</u>**

කාඩ්පත එහි මුහුණතෙහි මුද්‍රණය කර ඇති කල් ඉක්තුවීමේ දිනය තෙක් වලංගු වනු ඇත. කාඩ්පතහෙි වලංගුතාවය නැවත අලුත් කිරීම 5.6 වගන්තියෙහි දක්වා ඇති ආකාරයට වේ.

16. **<u>කාඩ්පත බැංකුවේ දේපලක්ව පවතී.</u>**

කාඩ්පත බැංකුව සතු දේපලක්ව පවතින අතර, එයට ප්‍රාථමික කාඩ්පත් සාමාජිතයකුගේ හෝ වෙනත් අතිරේක කාඩ්පත් හිමියකුගේ කාඩ්පත භාවිතා කිරීමේ අයිතිය ඕනෑම අවස්ථාවක අවලංගු කළ හැක. බැංකුවට මෙම අයිතිය කාඩ්පත් සාමාජිකයාට දැනුම්දීමක් කර හෝ නොකර සහ හේතුවක් දක්වා හෝ නොදක්වා ක්‍රියාත්මක කළ හැක. බැංකුව අවලංගු කරන ලද කාඩ්පත් " Cancellation Bulletin" හි ලැයිස්තු ගත කරයි. නොඑසේනම් සේවා සැපයුම් ආයතන වලට කාඩ්පත ප්‍රත්‍යාදිෂ්ට හෝ අවලංගු කළ බවට දැනුමේ දේ.

බැංකුව කාඩ්පත ප්‍රත්‍යාදිෂ්ට කරන්නේ නම් කාඩ්පත් සාමාජිකයා කාඩ්පත බැංකුවට ආපසු භාරදිය යුතුය. එසේම සේවා සැපයීමේ ආයතනයක් විසින් කාඩ්පත් හිමියකු හට කල් ඉකුත් වූ හෝ ප්‍රත්‍යාදිෂ්ට කරන ලද කාඩ්පතක් භාරදෙන ලෙසට ඉල්ලා සිටියහොත් කාඩ්පත් සාමාජිකයා විසින් එසේ කළ යුතුය. කාඩ්පත් සාමාජිකයා කාඩ්පත් කල් ඉකුත් වූ පසුව හෝ එය ප්‍රත්‍යාදිෂ්ට කිරීමෙන් පසුව භාවිතා නොකළ යුතුය. කාඩ්පත ප්‍රත්‍යාදිෂ්ට කිරීමෙන් හෝ කල් ඉකුත් වීමෙන් පසුව කරන ලද සියලු ගෙවීම් වලට කාඩ්හිමියා තවදුරටත් වගකීමෙන් බැඳේ.

කාඩ්පත ප්‍රත්‍යාදිෂ්ඨ කිරීම, නැවත සන්තකයට ගැනීම, ආපසු භාරදෙන ලෙසට ඉල්ලා සිටීම කාඩ්පත් සාමාජිකයාගේ චරිතය හෝ විශ්වසනීයත්වය පිළිබඳව කිසිදු පිළිඹිබුවක් නොකරන අතර, බැංකුව කිසිදු ආකාරයෙන් වෙනත් පුද්ගලයකු විසින් කාඩ්පත ආපසු හෝ භාරදෙන ලෙසට ඉල්ලමින් කරන කිසිදු ප්‍රකාශයකට වගකීමන් නොමැත.

තවදුරටත් කාඩ්පත සමග වන වරප්‍රසාද සහ පහසුකම් බැංකුවේ පූර්ණ අභිමතය පරිදි ඕනෑම අවස්ථාවක කාඩ්පත් සාමාජිකයාට දැනුම්දීමකින් තොරව හෝ එයට කිසියම් හේතුවක් නොදක්වා ඉල්ලා අස්කර ගත හැක.

17. **<u>අයකිරීම්</u>**

17.1 බැංකුවේ ඉල්ලීම පරිදි කාඩ්පත නිකුත් කිරීමේදී සහ බැංකුව විසින් නිකුත් කරන සෑම අතිරේක කාඩ්පතකටම බැංකුව විසින් නියම කරන සම්බන්ධිත මුදලක් ගෙවීමට කාඩ්පත් සාමාජිකයා එකග වේ.

17.2 කාඩ්පත භාවිතා කිරීමට වාර්ෂික ගාස්තු ගෙවිය යුතු අතර කාඩ්පත් සාමාජිකයාට බැංකුව විසින් දැනුම්දෙනු ලබන අනුපාතිකයක් යටතේ ඉදිරියට බිල්කල හැක.

17.3 කාඩ්පත එතෙර ලිපිනයකට කුරියර් කල විටක බැංකුව විසින් කාඩ්ගිණුමට සම්බන්ධිත ගාස්තුවක් හරකරනු ඇත.

17.4 මුල්‍ය සීමාවන් වැඩිකිරීමේ සම්බන්ධිත ගාස්තුව කාඩ්පත් ගිණුමට හර කරනු ඇත.

17.5 ගිණුම් ප්‍රකාශයන් හි පිටපත් වලට සම්බන්ධිත ගාස්තු කාඩ්පත් ගිණුමට හරකරනු ඇත.

17.6 කාඩ්පත් සාමාජිකයකු විසින් ගෙවිය යුතු දිනට සම්පූර්ණ හිග හිටවා ඇති මුදල නොගෙවන්නේ නම් ගිණුම් ප්‍රකාශයේ දිනට සම්පූර්ණ හිග හිටවා ඇති ශේෂයට මුල්‍ය අයකිරීමක් එකතු වන අතර එය බැංකුව විසින් තීරණය කරනු ලබන අනුපාතිකයකට ගණනය කරනු ලබන කාලසීමාවේ දෛනික ශේෂයට ගණනය කරනු ඇත. මුල්‍යමය අයකිරීම් මිලග ගිණුම් ප්‍රකාශයේ දිනට කාඩ්පත් ගිණුමට හරවනු ඇත.

17.7 ඉහත 17.6 වගන්තියේ සඳහන් කල මුල්‍ය අයකිරීම් ගෙවීමට අගති රහිතව කාඩ්පත් සාමාජිකයා විසින් අවම ගෙවිය යුතු මුදල ගෙවීම් කල යුතු දිනට ගෙවිය යුතු සම්පූර්ණ අවම මුදල ගෙවීමට අපොහොසත් වන්නේ නම් ඒවා බැංකුව විසින් නියම කරනු ලබන අනුපාතිකයකට කාඩ්පත් ගිණුමට හරවනු ඇත.

17.8 කාඩ්පත් සාමාජිකයා විසින් නිකුත් කර ඉදිරිපත් කරන හෝ වෙනත් පාර්ශවයක් විසින් බැංකුවට ඉදිරිපත් කරන චෙක්පතක් හෝ වෙනත් ගෙවීම් ආඥාවක් කිසියම් හේතුවක් නොමැතිව අගරු වන්නේ නම් බැංකුව කාඩ්පත් හිමියාගෙන්, බැංකුව විසින් නියම කරනු ලබන අනුපාතිකයකට කාඩ්පත් ගිණුමකට හරවනු ඇත. මෙම අයකිරීම බැංකුව විසින් අයකරනු ලබන තැපැත් ගාස්තු වලට අමතරව වේ.

17.9 සියලු මුල්‍ය අත්තිකාරම් වලින් මුල්‍ය අත්තිකාරම් මුදලක් සහ/හෝ සම්බන්ධිත ගාස්තුවක් බැංකුව විසින් නියම කරනු ලබන අනුපාතිකයකට කාඩ්පත් ගිණුමට හරකරනු ඇත. කාඩ්පත මගින් මිලදී ගන්නා මුදල් බවට පහසුවෙන් පත්කල හැකි සංචාරක චෙක්පත් විධාන කෙටුම්පත් ටෙලිග්‍රැෆික් පැවරුම් වැනි සාධන පත්‍ර මුදල් අත්තිකාරම් වශයෙන් සලකන අතර ඉහත අයකිරීම් වලට යටත් වේ.

17.10 ගණනය කරනු ලබන කිසියම් අවස්ථාවක නියම කර ඇති මුල්‍ය සීමාව ඉක්ම වුවහොත් සීමාව ඉක්මවා යෑමේ අය කිරීමක් කාඩ්පත් ගිණුමෙන් හර වනු ඇත. එය එක් ගිණුම් කාලයකට අයකෙරේ. මුල්‍ය සීමාව ඉක්මවා ඇද්ද නැද්ද යන්න ගණනය කිරීමේ අරමුණ සඳහා බැංකුව විසින් කරනු ලබන එවැනි අය කිරීම්ද සලකා බලනු ලැබේ.

17.11 විකුණුම්/මුදල් අත්තිකාරම් කෙටුම්පත්, ඡායා පිටපත් වලට බැංකුව විසින් තීරණය කරන අනුපාතිකයකට සමුද්ධරණ ගාස්තුවක් (retrieval fee ) කාඩ්පත් ගිණුමට හර කරනු ඇත

17.12 කලින් කලට අදාල වන ව්‍යවස්ථාපිත ගෙවීම් වෙතොත් කාඩ්පත් සාමාජිකයාගේ කාඩ්පත් ගිණුමෙන් එය අයකෙරේ.

17.13 බැංකුව විසින් වාර්ෂිකව ප්‍රකාශයට පත්කරනු ලබන බදු පිළිබඳ පෙතෙහි මුල්‍ය අයකිරීම් වල විස්තර සහ කාඩ්පත් වලට සහ කාඩ්පත් භාවිතා කිරීමේදී අදාල වන අනෙකුත් ගාස්තු සහ අය කිරීම් පිළිබඳව සඳහන් වන අතර එකී පොත් වල පිටපත් ලංකාවේ ඕනෑම බැංකු ශාඛාවකින් සහ කාඩ්පත් මධ්‍යස්ථානයකින් ඉල්ලා ලබාගත හැකිය. සියලුම අයකිරීම් ගාස්තු පොලී අනුපාතිකයන් දඩ බැංකුවේ පූර්ණ අභිමතය මත දැනුම්දීමකින් තොරව වෙනස් කිරීමට හැකි අතර, බදු පිළිබඳව එවැනි වෙනස්කිරීම්/එකතු කිරීම් ගිණුම් ප්‍රකාශය සමග විස්තරාත්මකව ඇමුණුමක් මගින් හෝ ලංකාවේ පළකරනු ලබන පුවත්පත් එකක් හෝ කිහිපයක මුද්‍රණය කොට කාඩ්පත් සාමාජිකයන්ට දැනුම්දෙනු ඇත.

17.14 කාඩ්පත් සාමාජිකයකු විසින් කරන ලද ඉල්ලීමකට අනුව කරන අමතර සේවාවකට අදාලව ගාස්තුවක් අයකර ගැනීමේ අයිතිය බැංකුව රඳවා තබාගන්නා අතර එවැනි ගාස්තුවක් සම්බන්ධයෙන් කාඩ්පත් ගිණුම හර කළ හැක.

17.15 බැංකුව විසින් ප්‍රදානය කරනු ලබන කිසියම් ගාස්තු අඩුකිරීමක් හෝ නොසලකාහැරීමක් බැංකුවට සිය අභිමතය පරිදි ඕනෑම අවස්ථාවක ඉල්ලා අස්කර ගැනීමකට හෝ පාලනය කළ හැක. බැංකුවට සිය අභිමතය පරිදි කාඩ්පත් වර්ගය සහ අවස්ථානුගත කරුණු මත ඇතැම් ගාස්තු මුක්ත කළ හැක.

## 18 <u>ගුවන් සේවාවන් සමග වන ගණුදෙනු</u>

කාඩ්පත් භාවිතා කිරීම මගින් ගුවන් ප්‍රවේශ පත්‍රයක් වෙන්කරවා ගත් විටක කාඩ්පත් සාමාජිකයාට ගුවන් ප්‍රවේශ පත්‍ර මිලදීගැනීමට අදාල මුදල් අතිරේක ගාස්තුවක් වෙතොත් එයද ගෙවීමට යටත්ව ගෙවීමට සිදුවන අතර එය ගිණුම් ප්‍රකාශයෙහි බිල් කරනු ඇත. පසුව අවලංගු කරනු ලබන යම් ප්‍රවේශ පත්‍රයකට අදාලව සේවා සැපයුම් ආයතනය වෙත අදාල මුදල් ලැබුණු පසු එම මුදල් කාඩ්ගිණුමට බැර වේ. (අවලංගු කිරීමේ ගාස්තු අඩු කොට)

19. <u>ආරවුල්</u>

බැංකු සේවා ආයතනයකින් කිසියම් වියදම් හෝ ගෙවීම් අයදුම් පතක් ලැබුණු විට 27(1) සහ 27(2) වගන්තින් යටතේ කාඩ්පත් නැතිවූ සොරකම් කරන ලද බැව් නිසි පරිදි දන්වා ඇති විටක හැර එවැනි අයදුම්පතක වාර්තාකර ඇති වියදම් කාඩ්පත් සාමාජිකයා විසින් කාඩ්පත මගින් දරන ලද බවට නිශ්චිතව සාක්ෂියක් වේ. කාඩ්පත වංචනික ලෙස භාවිතා කරන ලද බවට ඔප්පු කිරීම කාඩ්පත් සාමාජිකයා සතු වේ. මෙම වගන්තියේ සඳහන් වන වෙනත් ගෙවීමේ ඉල්ලීම් කාඩ්පත් සාමාජිකයා විසින් කාඩ්පත භාවිතය මගින් සේවා සැපයුම් අයතනයකදී දරන ලද අනිත් සහ සියලු අනුමත වියදම් වන අතර ඒ යටතේ අයකිරීමක් ලෙස සඳහන් නොවන විවිධ හොටල් ගාස්තු ආදිය වේ. එවැනි ගෙවීම්, පත්‍රිකාවක් මත කාඩ්පත් සාමාජිකයාගේ අත්සන සමග කාඩ්පත් සාමාජික අංකය සඳහන් කොට ඇත්නම් එය කාඩ්පත් සාමාජිකයා දරනු ලබන වගකීම් ප්‍රමාණය පිළිබඳව බැංකුව සහ කාඩ්පත් සාමාජිකයා අතර, අවසානාත්මක සාක්ෂියක් වන අතර බැංකුව විසින් කාඩ්පත් සාමාජිකයාට මිලදීගත්/මිලදීගැනීමට වන භාණ්ඩ නිසි පරිදි ලැබුණේද හෝ කාඩ්පත් සාමාජිකයා තෘප්තිමත් වන ආකාරයට ලදසේවාව හෝ ලැබීමට ඇති සේවාව නිසි පරිදි ලැබුණේද යන්න තහවුරු කිරීම අවශ්‍ය වන්නේ නැත. ප්‍රකාශනයේ සඳහන් යම් ගාස්තුවක් සම්බන්ධයෙන් කාඩ්පත් සාමාජිකයා එකග නොවන විටකදී ඒ බැව් ප්‍රකාශනය ලැබ් දින 20 ක් තුළදී බැංකුවට දැනුම්දිය යුතු අතර, එසේ කිරීමට අපොහොසත්වීම මත සියලු ගාස්තු සහ ප්‍රකාශන සම්පූර්ණයෙන් විධිත් බවට අර්ථනිරූපණය කරනු ඇත. ගෙවන ලද/ගෙවීමට ඇති ගාස්තුවක් ලද/ලැබීමට වන සේවාවන් සම්බන්ධයෙන් කාඩ්පත් සාමාජිකයාගේ ගිණුමෙන් අයකිරීමට බලය සේවා සැපයුම් ආයතනයකදී භාවිතා කරන බැංකුව විසින් ලබාදෙන ගෙවීම් පත්‍රිකාවක් හෝ බැංකුව විසින් තීරණය කරනු ලබන වෙනත් ආකාරයකට විය හැක. කාඩ්පත් සාමාජිකයා විසින් අනතුරුව කිසිදු විභ්‍රමයකින් තොරව පොලිය සහ අදාළ වෙනත් ගාස්තුද සමග ගාස්තු ගෙවිය හැක.

20. <u>කාඩ්පත අගරුවීම</u>

කිසියම් සේවා ආයතනයක් විසින් කාඩ්පත භාවිතා කිරීමට භාරගැනීම සම්බන්ධයෙන් බැංකුව කිසිදු වගකීමක් නොදරන අතර, කාඩ්පත භාරගැනීමට කිසියම් සේවා සැපයුම් ආයතනයක් විසින් ප්‍රතික්ෂේප කිරීමේ වගකීමද භාරගන්නේ නැත.

21. <u>නම සහ ලිපිනය වෙනස්වීම</u>

සෑම කාඩ්පත් සාමාජිකයෙක් විසින්ම සිය නම හෝ ලිපිනයෙහි කිසියම් වෙනසක් වුවහොත් ඒ පිළිබඳව බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානයට ලිඛිතව දැනුම්දිය යුතුය.

22. <u>භාණ්ඩ හා සේවාවල ගුණාත්මක භාවය.</u>

සේවා ආයතනයකින් කාඩ්පත් සාමාජිකයකු තැපැල් ඇණවුමක් මගින් ලබාගන්නා අලෙවි, වොරන්ටි හෝ සේවා මිලදී ගැනිම සම්බන්ධයෙන් වන භාරදීමේදී සිදුවන ප්‍රමාදයන්, භාරනොදීම් සහ භාණ්ඩ නොලැබීම හෝ දෝෂ සහිත භාණ්ඩ ලැබීම් වලට බැංකුවේ වගකීමක් නැත. කාඩ්පත් සාමාජිකයකුට භාණ්ඩ මිලදී ගැනීමට හෝ සේවාවන් ලබාගැනීමට ලැබෙන පහසුකමක් වන අතර බැංකුව භාණ්ඩ වල ගුණාත්මක තත්ත්වය, ප්‍රමාණාත්මක බව භාරදීම හෝ වෙනත් කාරණයක් සම්බන්ධයෙන් සේවා ආයතනයක් සමග කාඩ්පත් සාමාජිකයකු ඇති වන ආරවුල් වලට බැංකුව වගකීමක් නොමැත.

## 23. කාඩ්පත් සාමාජිකයන් සඳහා රක්ෂණ ආරක්ෂාව

බැංකුව සිය අභිමතය පරිදි කාඩ්පත් සාමාජිකයකුට නොයෙක් රක්ෂණ නිෂ්පාදන වරින් වර ලබාදෙයි. කෙසේ වුවද එවැනි රක්ෂණ පිළිබඳ හිමිකම්පෑම් අදාළ රක්ෂණ සපයන සමාගම් වෙත සෘජුව කළ යුතුය. එවැනි රක්ෂණයක් මගින් උද්ගත වන නෙගේවා සිටීමක් හෝ ආරවුලකට බැංකුව වගනොකියන අතර, එවැනි ගැටළු කාඩ්පත් සාමාජිකයා සහ රක්ෂණ සමාගම විසින් විසඳගත යුතුය.

අදාළ රක්ෂණ, බැංකුව විසින් කලින් කලට දැනුම්දෙනු ඇති අතර ඒවා බැංකුවේ අභිමතය පරිදි සංශෝධනය හෝ වෙනස් කෙරෙනු ඇත. විවිධ රක්ෂණ ප්‍රතිපත්තීන් සඳහා රක්ෂණ සමාගම විසින් තීරණය කරනු ලබන වෙනත් කොන්දේසින් හා නියමයන් අදාළ වනු ඇත. නියමන් සහ කොන්දේසි සමග වන රක්ෂන ප්‍රතිපත්ති ඉල්ලීම අනුව ලබාදෙනු ඇත.

## 24. ගෙවිය යුතු අවම මුදල.

ගෙවිය යුතු අවම මුදල ප්‍රකාශනයහි දක්වෙනු ඇත. මුදල් ප්‍රමාණය බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ඇති අතර. එය ප්‍රකාශනයෙහි හෝ තීරණය හිග හිටවා ඇති මුදලෙහි අනුපාතයක් ලෙස (වඩා වැඩි මුදල) ගණනය කරනු ඇත. (ඉන් කුමක් වුවද ගෙවිය යුතු අවසාන මුදල කාඩ්පත් සාමාජිකයා විසින් ගෙවිය යුතු දිනට හෝ ඊට ප්‍රථම බැංකුවට ගෙවිය යුතුය. ගෙවීම සිදුවන්නේ බැංකවු ගෙවීම ලද විටදී සහ එම මුදල කාඩ්පත් සාමාජිකයාගේ ගිණුමට බැර කළ විටදී පමණක් වන අතර කාඩ්පත් සාමාජිකයා එය පිටත් තොට යැව් විටදී නොවේ.

අයිරාව හෝ මූල්‍ය සීමාව ඉක්මවා ගිය විටක කාඩ්පත් සාමාජිකයා විසින් බැංකුවට වහාම ගෙවීම අවශ්‍ය වන අතර, එය ප්‍රකාශනය මගින් දැනුම්දෙනු ඇත. කාඩ්පත් සාමාජිකයා විසින් බැංකුවට සිදුකරන ගෙවීම, ගෙවිය යුතු අවම මුදලට වඩා වැඩි විය හැකි හෝ ගෙවීම් කළ යුතු දිනට සිදුකිරීමට හෝ බිල් කරන කාලයේදී එක්වරකට වඩා වැඩි විය හැක.

එවැනි ගෙවීම් ප්‍රකාශනයෙහි සඳහන් කර ඇති ආකාරයට ශ්‍රී ලංකා රුපියල් වලින් බැංකුවට ගෙවිය යුතුය.

**25.** **<u>වගකීම් බැහැර කිරීම</u>**

බැංකුව ඍජුව හෝ වක්‍රාකාරයෙන් සිදුවන කිසියම් පාඩුවකට හෝ අලාභයක් සම්බන්ධයෙන් කාඩ්පත් සාමාජිකයාට කිසිදු වගකීමක් නොමැත.

(a) සපයන ලද භාණ්ඩ හෝ සේවාවක වන දෝෂයක් සම්බන්ධයෙන්.

(b) කිසියම් පුද්ගලයකු විසින් කාඩ්පතට ගරු කිරීම හෝ භාරගැනීම ප්‍රතික්ෂේප කිරීම.

(c) කිසියම් පරිගණක පර්යන්ත්‍රයක් සහ/හෝ EDB යන්ත්‍රයක් ක්‍රමවත්ත ක්‍රියා නොකිරීමෙන්.

(d) කාඩ්පත් සාමාජිකයකු නොවන වෙනත් අයකු විසින් දෙනු ලබන ගණුදෙනු කිරීමේ උපදෙස් ලබාදීමේදී.

(e) කාඩ්පත ආපසු එවන ලෙසට ඉල්ලමින් යම් තැනැත්තකු විසින් කරන ලද ප්‍රකාශයක් හෝ ඒ හා සැබැඳිව යම් පුද්ගලයකු විසින් කරනු ලබන ඕනෑම ක්‍රියාවක්

(f) කාඩ්පත් සාමාජිකයා විසින් බැංකුවේ කර්යභාර නිළධාරියකුට හැර වෙනත් පුද්ගලයකුට කාඩ්පත් ලබාදිම.

(g) බැංකුව විසින් කාඩ්පත අවලංගු වනවා යැයි මුහුණතේ සඳහන් වන දිනට පෙර කාඩ්පත පවරාදෙන ලෙසට විධාන කිරීමේ අයිතිය බැංකුව විසින් ක්‍රියාත්ම කිරීම. එකී විධාන කිරීම හෝ පවරාදිම බැංකුව විසින් ඍජුවම කිරීම හෝ කරනු ලැබිම හෝ සේවා සැපයුම් ආයතනයක් හෝ බැංකුවේ නියෝජිතයකු මගින් කිරීම.

(h) බැංකුව විසින් කාඩ්පත් හෝ කාඩ්පත් ගිණුම් අවසන් කිරීමට වන සිය බලය ක්‍රියාත්මක කිරීම.

(i) කාඩ්පත නැවත අත්පත් කරගැනීම සහ/හෝ කාඩ්පත නැවත එවීම හෝ කාඩ්පතට ගරු කිරීමට සේවා ආයතනයක් විසින් ප්‍රතික්ෂේප කිරීම නිසා අයදුම්කරුගේ හෝ කාඩ්පත් සාමාජිකයාගේ මූල්‍ය තත්ත්වයට හෝ කීර්තියට සිදුවන්නේ යැයි කියන හානිය.

(j) **26** වන වගන්තිය යටතේ බැංකුවට කරන ලද දුෂ්ප්‍රකාශයක්, අවනිදේශනයක්, දෝෂයක් හෝ අත්හැරීමක් වැනි කරුණු සැගවීමක්.

(k) ගාස්තු ගෙවීම කිසියම් කාරණයක් නිසා පැහැර හැරීම.

(l). හිග මුදල් ගෙවීමට බැංකුව හෝ බැංකුවේ බලයලත් නියෝජිතයකු විසින් විධාන කිරීම/හිමිකම්පෑම අපහාසයක් හෝ කාඩ්පත් සාමාජිකයාගේ චරිතය පිළිබඳ පිළිඹිබුවක් කිසිදු ආකාරයකට සිදුනොවේ.

තෙවන පාර්ශ්විය සේවා සැපයුම්කරු වෙත සහ/හෝ එවැනි තෙවන පාර්ශවිය සේවා සැපයුම්කරුවකුගේ කොන්ත්‍රාත්කරුවකු විසින් විවිධ සේවාවන් සඳහා කරන සංනිවේදනය කිරීම සහ පිළියෙළ කිරීම් වලට එවැනි තෙවැනි පාර්ශවිය සේවා සැපයුම්කරුවකු හෝ බැංකුව විසින් ගෙවනු ඇත. කාඩ්පත් සාමාජිකයා විසින් එවැනි සියලු ගෙවීම් සඳහා වගකිව යුතු වේ. උපරිම පරිශ්‍රමයක් යන පදනම යටතේ සහයෝගය ලබාදෙන අතර, කාලය පිළිබඳව ප්‍රශ්න දුර ප්‍රමාණය සහ ස්ථානය අනුව එකී සහයෝගය නොලැබී යනු ඇත. තෙවන පාර්ශවයේ සේවා සැපයුම්කරුවකු විසින් යෝජනා කරනු ලබන සහ/හෝ පත්කරනු ලබන රක්ෂණ, වෛද්‍ය සහ/හෝ නීතිවෘත්තිකයන් ඔවුන්ගේ සේවා නියුක්තිකයක් නොවන අතර, සේවා සැපයුම්කාර තෙවන පාර්ශවිය කොන්ත්‍රාත්කරුවන්ගේ සේවකයකු නොවේ. ඒ අනුව ඔවුන් රක්ෂණ, වෛද්‍ය, නීති සේවාවන් මගින් උද්ගත වන වැඩෙහි යෙදන බවට, ප්‍රයෝජන ගන්නා බවට, ක්‍රියාකිරීමට නොසළකාහැරීමට වගකීමක් නොමැත. බැංකුව සේවා සැලසුම්කිරීම හෝ භාවිතා කිරීම සේවා සම්බන්ධයෙන් කිසිදු ආකාරයක වගකිව යුතු හෝ වගකීම භාරගත යුතු නොවේ.

26. <u>තොරතුරු හෙළි කිරීම</u>

පොදු නීතිය යටතේ මෙහි අවශ්‍ය ප්‍රමාණයට, මෙහි මින්මතුවට දක්වා ඇති 26 වන වගන්තියට යටත්ව බැංකුව කාඩ්පත් හිමියා සහ බැංකු අතර පවතින සියලුම කටයුතු සහ ගණුදෙනු පිළිබඳව වන සියලුම තොරතුරු වල රහස්‍ය භාවය සුරකී. එනෙකුදු වුවත් මතු දක්වෙන දෑ සම්බන්ධයෙන් තොරතුරු ලබාදීමට කාඩ්පත් සාමාජිකයා බැංකුවට බලය ලබාදේ.

(a) මුදල් ගෙවීම පැහැර හරිනා සේවාදයකයින් සම්බන්ධයෙන් ණය ආයතනයක් හෝ දත්ත ගබඩාවක් පවත්වාගෙන යන කිසියම් බැංකුවකට, මූල්‍ය ආයතනයකට හෝ ණය ආයතනයකට.

(b) මෙම ගිවිසුම් කාඩ්පත් ගිණුම යටතේ කිසියම් අයිතියක් වෙනුවෙන් සත්‍ය හෝ යෝජිත පැවරුම් ලාභීන් වෙත,

(c) බැංකුව වෙත විශ්වාසනීය ලෙස ක්‍රියාකිරීමේ යුතුකම ඇති යම් නියෝජිතයකු, කොන්ත්‍රාත්කරුවකු හෝ සේවා සැපයුම්කරුවකුට හෝ අදාළ සමාගමක්

(d) කිසියම් අධීක්ෂණ හෝ පාලන අධිකාරියක්,

(e) ශ්‍රී ලංකාවේ නීතින් යටතේ යමක් කිරීමට නියම කරනු ලැබුවකුට,

(f) බැංකුව සමග වාණිජ්‍ය පාරමාර්ථයෙන් සම්බන්ධවී ඇති කිසියම් කාර්යාලයක් හෝ සමාගමක ශාඛාවක්,

(g) ඇමරිකන් එක්ස්ප්‍රස් සමාගම හෝ එහි අනුබද්ධ සමාගම්

27. <u>නැතිවූ කාඩ්පත් සම්බන්ධ වගකීම්</u>

කාඩ්පතක් නැතිවූවහොත් හෝ සොරකම්කරන ලැබුව හොත් කාඩ්පත් සාමාජිකයා විසින් ශ්‍රී ලංකාවේ කාඩ්පත් මධ්‍යස්ථානයකට වහාම දැනුම්දිය යුතුය. කාඩ්පත් සාමාජිකයා විසින් නැතිවීම/හොරකම සිදුවූ ප්‍රදේශයේ පොලිසිය හෝ නීතිය ක්‍රියාත්මක කිරීමේ ආයතනයකට වාර්තාවක් ගොනුකළ යුතුය. ශ්‍රී ලංකාවේ කාඩ්පත් මධ්‍යස්ථානයට නැති වූ බව දැනුම්දෙන තුරු කාඩ්පත මත දරන්නා වූ වියදම් වල වගකීම කාඩ්පත් සාමාජිකයා සතු වේ.

කාඩ්පත් සාමාජිකයාට කාඩ්පත නැතිවීම සම්බන්ධයෙන් දුරකථනයෙන් වාර්තා කළ හැකි අතර, ඉන් පසුව කාඩ්පත් නැතිවූ බව තහවුරු කරමින් හෝ වියදම් අත්හැර දමමින් සහතික කරන ලද දිවුරුම් ප්‍රකාශයක් කාඩ්පත් මධ්‍යස්ථානයට යැවීමෙන් හෝ නැතිවීම සිදුවූ ප්‍රදේශයේ පොලිස් ස්ථානයේ හෝ නීතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිත ආයතනයක ගොනු කරන ලද වාර්තාවේ සහතික කරන ලද පිටපතක් බැංකුව වෙත ලබාදීම කළ හැක.

28 <u>ගෙවීම.</u>

28.1 ප්‍රකාශනය ලැබීමෙන් අනතුරුව කාඩ්පත් සාමාජිකයා විසින් ප්‍රකාශනයේ විස්තර කර ඇති "ගෙවිය යුතු අවම සම්පූර්ණ මුදල" හෝ බැංකුවට ගෙවිය යුතුය. සෑම අතිරේක කාඩ්පත් සාමාජිකයකුම ප්‍රකාශනය ලැබීමෙන් අනතුරුව ප්‍රාථමික කාඩ්පත් සාමාජිකයා සමග ගෙවිය යුතු අවම සම්පූර්ණ මුදල බැංකුවට එක්ව සහ වෙන්වෙන්ව ගෙවීමට වගකීමෙන් බැඳේ.

28.2 මෙම ගිවිසුමෙහි වන නියමයන් හෝ කොන්දේසින් වලින් කිසිවක් හෝ නීතියෙහිලා හෝ බැංකුව සහ කාඩ්පත් සාමාජිකයා අතර කලින් කලට ඇතිවන්නා වූ වෙනත් ගිවිසුමක් නිසා පවත්නා බැංකුවේ හිලව් කිරීමට, පැවරීමට සහ මුදල් උපයෝගිකර ගැනීමට වන අයිතියට බල නොපැවැත්වේ. බැංකුවට ලියමයක් වශයෙන් තබාගෙන ඇති තැන්පතුවකට විරුද්ධව විවෘත කර ඇති විටක තැන්පතුවෙහි අදයම් කාඩ්පත් සාමාජිකයාගේ ගිණුමේ හිග හිටවා ඇති මුදලට එරෙහිව ගලපනු ඇත.

**28.3** කාඩ්පත් සාමාජිකයාගේ වගකීම සම්බන්ධයෙන් බැංකුවට වන ගෙවීම් අදාල නිෂ්කාෂණය වූ මුදල් බැංකුවට ලැබෙන තෙක් බැංකුව වෙත සිදුනොකරන ලද බවට සලකනු ඇත.

**28.4** මෙම නියමයන් සහ කොන්දේසි යටතේ බැංකුවට අයවිය යුතු සියලු මුදල් කිසිදු ආකාරයක හිලව් කිරීමක් හෝ ප්‍රතිවිරුද්ධ ඉල්ලීමක් හෝ අනික් අතට බැංකුව විසින් වෙනත් පුද්ගලයකුගේ ලැබිය යුතු යැයි කියන හෝ හිඟ හිටවා ඇතැයි කියන මුදලක් කිසිදු ආකාරයකින් කපාහැරීමෙන් තොරව ගෙවිය හැකිය. කාඩ්පත් සාමාජිකයාගේ කිසියම් නෛතික සීමාවන් නුසුදුසුකමක් හෝ නොහැකියාවක් තිබුණේ වුවද බැංකුවට කාඩ්පත් සාමාජිකයාට අයත් බැංකුවේ සන්තකයේ , පාලනයේ හෝ බලයේ තිබෙන සියලු වත්කම්, මුදල්, තැන්පතු, සුරැකුම් පත් පොදු ලියමයක් යටතේ තබාගත හැක.

**28.5** භාණ්ඩ සහ/හෝ සේවා සැපයීම් සම්බන්ධයෙන් දෙන ලද යම් ණයමුදලක් බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානය වෙත බැංකුවට පිළිගත හැකි ආකාරයෙන් සහ ඇමරිකන් එක්ස්ප්‍රස් හි දැනට පවත්නා අදාල වන නියමයන් සහ කොන්දේසීන්ට අනුකූලව දැනුම්දීමක් ලද පසුව පමණක් බැංකුව විසින් කාඩ්පත් ගිණුමට අදාල කර ගනු ඇත.

**28.6** ගෙවීමක් නියෝජනය කරන චෙක්පතක්, ගෙවීමට ඉදිරිපත් කරන ලද බැංකුව විසින් කිසියම් හේතුවක් මත අගරු කරන ලද විටක, කාඩ්පත් සාමාජිකයා අදාල නීතිය යටතේ ආපරාධ නීතිකෘත්‍යයන් වලට වගකීමෙන් බැඳෙනු ඇත.

**28.7** කාඩ්පත් ගිණුමෙහි හිඟ හිටවා ඇති සම්පූර්ණ මුදල කාඩ්පත් සාමාජිකයා විසින් හෝ ඔහු මිය ගිය, වස්තු භංගත්වයට පත්වූ හෝ කාඩ්පත් සාමාජිකයාගේ ව්‍යාපාර ගණන් බේරා වසාදමන විටක ඔහුගේ අනුප්‍රාප්තිකයන් හෝ පැවරුම් ලාභීන් විසින් ගෙවිය යුතුය. නැවත ගෙවීමේ වගකීම කාඩ්පත් සාමාජිකයාගේ සේවා යෝජකයා විසින් දරනු ලබන අවස්ථාවක සහ එවැනි සේවා යෝජකයකුගේ ව්‍යාපාරය ගණන් බේරා වසාදමන ලද හෝ බුන්වත් භාවයට පත්ව ඇති විටක හෝ කිසියම් හේතුවක් මත වස්තු භංගත්වයට පත්ව ඇතැයි ප්‍රකාශ කර ඇති විටක සහ/හෝ එවැනි ගෙවීමක් කල නොහැකි විටක බැංකුව සම්පූර්ණයෙන් සෑහීමට පත්වන පරිදි සියලු හිඟ මුදල් පෞද්ගලිකව ගෙවීමට කාඩ්පත් සාමාජිකයා වගකීමෙන් බැඳේ.

**28.8** ප්‍රකාශනය නොලැබීම කාඩ්පත් සාමාජිකයා විසින් ගෙවීම් නිසි කලට නොගෙවීමට ප්‍රමාණවත් හේතුවක් වශයෙන් අර්ථ විග්‍රහා කල යුතු නොවේ. කිසියම් හේතුවක් මත ප්‍රකාශනය නොලද විටක, ඔහුගේ/ඇයගේ අවසාන ශේෂය සහ/හෝ ප්‍රකාශනයෙහි 2වන පිටපත බැංකුව වෙත ඇමතුමක් ලබාදී ඉල්ලා සිටීමටත් අදාල වන සියලු ගාස්තු බැංකුවට ගෙවීමටත් කාඩ්පත් සාමාජිකයා ප්‍රතිඥා දෙයි.

28.9 චෙක් තැන්පතු අයකිරීමේ ක්‍රමයක් වශයෙන් පිළිගනු ලබන අතර, චෙක්පත උපලබ්ධි වී ගෙවීම් කරන බැංකුව විසින් මුදල් ගෙවන තුරු බැංකුවට මුදල් ලැබී නොමැති බව සැලකේ. ඕනෑම මුදල් තැන්පතුවක් කාඩ්පත් ගිණුමට බැර වූ විටෙක පමණක් එය බැංකුව වෙත ලැබුණා සේ සලකනු ඇත.

28.10 කාඩ්පත් සාමාජිකයා විසින් ගෙවීම් සිදුකල යුතු දිනට කාඩ්පත් සාමාජිකයා කාඩ්පත් බිලෙහි හිඟ හිටවා ඇති මුදලින් ප්‍රතිශතයක් කාඩ්පත් සාමාජිකයාගේ ජංගම හෝ ඉතුරුම් ගිණුම හර කිරීම මගින් ගෙවන ලෙසට බැංකුවට වෙත ඉදිරිපත් කිරීමට කාඩ්පත් සාමාජිකයා එකඟ වේ.

28.11 එවැනි ඕනෑම ස්ථාවර උපදෙසකට වන සංශෝධනයක් හෝ අවලංගු කිරීමක් අවම වශයෙන් මීළඟට ගෙවීම් කළයුතු දිනයට සති දෙකකට ප්‍රථමයෙන් හෝ බැංකුව වෙත ඉදිරිපත් කිරීමට කාඩ්පත් සාමාජිකයා එකඟ වේ.

28.12 ගිණුමක මුදල් නිරාකරණය කිරීම සඳහා බැංකුවට ලබාදෙන ඍජු ස්ථාවර හර උපදෙසකට පහත දැක්වෙන අමතර කොන්දේසින් සහ නියමයන්ද අදාළ වේ.

අ. එවැනි ස්ථාවර උපදෙසකට එරෙහිව බැංකුව වෙත ඉදිරිපත් කරන චෙක්පතක් හෝ වෙනත් සැලසුමක් සම්බන්ධයෙන් පූර්වතාවය ලබාදීමේ අයිතිය බැංකුව විසින් රඳවා තබා ගැනීමට කාඩ්පත් සාමාජිකයා එකඟ වේ.

ආ. ස්ථාවර උපදෙසකට අනුකූලවීම සඳහා අදාල නිරාකරණ ගිණුමට, ගෙවීමට නියමිත දිනට පෙර ප්‍රමාණවත් මුදල් ලබාදීමට කාඩ්පත් සාමාජිකයා එකඟ වේ. නිරාකරණ ගිණුමේ ප්‍රමාණවත් මුදලක් නොමැති විටෙක බැංකුව සිය අභිමතය පරිදි එකී ස්ථාවර උපදේශයේ සඳහන් ගෙවී යුතු මුදල ආවරණය කිරීම සඳහා කලින් කලට අයිරා ලබාදෙනු ඇත. විධාන කල විටෙක සියලු හිඟ හිටවා ඇති මුදල සමඟ ඒ මත වන මූල්‍යමය වෙනත් ගෙවීම් බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන අනුපාතයකට අනුව ගෙවීමට කාඩ්පත් සාමාජිකයා බැඳෙනු ඇත.

28.13 බැංකුව විසින් කිසියම් අවස්ථාවක දින රහිත චෙක්පතක් සහ/හෝ බැංකුව නමින් මුදල් සහිත සුරැකුමක් තැන්පත් කරන මෙන් කාඩ්පත් සාමාජිකයාට ඉල්ලා සිටිය හැකි අතර, එය කාඩ්පත් සාමාජිකයා කාඩ්පත නිකුත් කරන ලෙසට ඉල්ලා නෙමැති විටදී පවා අවශ්‍ය වියහැක. කාඩ්පත් සාමාජිකයා එවැනි අවස්ථාවක එකී චෙක්පත මත දිනයක් යෙදීමට සහ යොද ඇති දිනට බැංකුවට ගෙවිය යුතු මුදලට එරෙහිව එකී චෙක්පතක් ඉදිරිපත් කිරීමට බලය ලබාදී ඇති බවට සැලකේ.

28.14 කාඩ්පත් සාමාජිකයා ගෙවිය යුතු විටෙක යම් මුදලක් ගෙවීමට අපොහොසත් වුවහොත් හෝ එම මුදල් වෙනත් ආකාරයකින් ගෙවිය යුතු දිනට ප්‍රථම ගෙවිය යුතු යැයි ප්‍රකාශයට පත් කරන ලද්දේ නම් හෝ කාඩ්පත් සාමාජිකයා විසින් යම් මූල්‍යමය ණය වෙනත් පහසුකමක් බුක්ති විඳීම මත බැංකුව සමග වන ගිවිසුමක් යටතේ වන වෙනත් හිඟ මුදලක් ගෙවන්නේ නම් එවැනි විටකදී බැංකුව එක් එක් ගිවිසුමහි හෝ මෙම ගිවිසුමෙහි වන සිය අයිතීන් වලට අගති රහිතව මෙම ගිවිසුමෙහි දක්වා ඇති පරිදි බැංකුවේ පූර්ණ අභිමතය මත සිය පූර්ණ හෝ සියලු අයිතීන් ක්‍රියාත්මක කිරීමට හිමිකම් ලබනු ඇත.

28.15 කිසියම් කාඩ්පත් සාමාජිකයකුගේ අයවිය යුතු මුදලක් සිය බලයලත් අයකර ගැනීමේ නියෝජිත ආයතනයකට පැවරීමේ අයිතිය බැංකුව රඳවා තබා ගන්නා අතර, එලෙස තිබීමේදී කරන ලද වියදම් කාඩ්පත් සාමාජිකයාගේ ගිණුමින් අයකර ගැනීමට බැංකුවට හිමිකම් ලබාදේ.

28.16 කාඩ්පත් සාමාජිකයා හෝ ඔහු වෙනුවෙන් ඉදිරිපත් කරන ලද ගෙවුම් උපකරණයක් ගරු නොකරන ලද අවස්ථාවක, කාඩ්පත් සාමාජිකයාට එරෙහිව නීතිමය වශයෙන් ක්‍රියාකිරීමටත්, සිය අභිමතය පරිදි දඩ මුදල් සහ/හෝ කාඩ්පත් ගිණුම අවලංගු කිරීමට බැංකුව අයිතිය රඳවා ගනී.

28.17 මෙම ගිවිසුමෙහි ඉහත දැක්වෙන ප්‍රතිපාදනයන්ට අගති රහිතව කාඩ්පත් සාමාජිකයා මසකට වඩා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටිනම් කාඩ්පත් සාමාජිකයා විසින් කාඩ්පත් ගිණුම පියවීම සම්බන්ධයෙන් පැහැදිලි සහ විශේෂ උපදෙස් ලබාදිය යුතු අතර, ඔහුගේ/ඇයගේ පිටත්වීමට ප්‍රථම එවැනි උපදෙස් පිළිබඳව බැංකුවේ කාඩ්පත් මධ්‍යස්ථානය අවවාද කළ යුතුය.

## 29. සංශෝධනයන්

මෙම ගිවිසුමෙහි කිසියම් නියමයන් පූර්ව දැනුම් දීමකින් තොරව කලින් කලට වෙනස් කිරීමට, සංශෝධනය කිරීමට සහ/හෝ අදේශ කිරීමට අයිතිය බැංකුව රඳවා තබාගනී. එවැනි ඕනෑම සංශෝධනයක් පහත දැක්වෙනන් 31 වන වගන්තිය යටතේ දැනුම්දීම මගින් ක්‍රියාත්මක සහ බලාත්මක කළ බවට සැලකේ.

## 30 අවවාද කිරීමේ ලුහුඩු ප්‍රකාශනයන්

ශ්‍රී ලංකාවේ හෝ විදේශයකදී වන අවවාද කිරීමේ ලුහුඩු ප්‍රකාශනයන්හිදී කාඩ්පත පිළිබඳව සඳහන් කරමින් සේවා සැපයුම් ආයතනයන්ට කාඩ්පත අත්පත් කර ගැනීමේ දැනුම්දීමේ පරම අයිතිය සහ අභිමතය බැංකුව සතු වේ.

31. **දැන්වීම්**

බැංකුව කිසියම් දැන්වීමක් කාඩ්පත් සාමාජිකයාට සාමාන්‍ය සහ අවසාන වශයෙන් දැන ගන්නට යෙදුනු ලිපිනයට පූර්ව ගෙවුම් තැපැල් මාර්ගයෙන් යවනු ඇති අතර, එවැනි ලේඛන අදාල ලිපිනයක පිටපත් කර යැවීමෙන් අනතුරුව යථාපරිදි භාරදුන්නා සේ සළකනු ලැබේ.

කාඩ්පත් ගිණුම් ප්‍රකාශයක සඳහන් කර ඇති හෝ ගිණුම් ප්‍රකාශනයෙහි කොටසක් වන්නා වූ යම් තොරතුරක් හෝ දැනුම්දීමක්ද මෙම ගිවිසුම යටතේ දැන්වීම් ලෙස සැලකේ.

කාඩ්පත් සාමාජිකයා විසින් යම් දැන්වීමක් බැංකුව වෙත එවන විට පූර්ව ගෙවුම් තැපැත් මගින් පහත ලිපිනයට එවීම හෝ තහවුරු කිරීම කල යුතුය.

නේෂන්ස් ට්‍රස්ට් බැංක් පීඑල්සී, ද ඇමරිකන් එක්ස්ප්‍රස් කාඩ් මධ්‍යස්ථානය, 256, ශ්‍රීමත් රාමනාදන් මාවත, කොළඹ 15.

32. **බලාත්ම කිරීමේ වියදම්.**

ප්‍රාථමික කාඩ්පත් සාමාජිකයා හෝ ඕනෑම අතිරේක කාඩ්පත් සාමාජිකයකු මෙම නියමයන් හා කොන්දේසි බලාත්මක කිරීමේදී හෝ බලාත්මක කිරීමට උත්සහා කිරීමේදී දරන්නට සිදුවූ සියලු වියදම් සියලූ නෛතික ගාස්තු සහ වියදම්ද ඇතුලුව පූර්ණ හානි පූරන පදනමක් යටතේ බැංකුවට එක්ව සහ වෙන් වෙන්ව හානි පූරණය කිරීමට වගකීමෙන් බැඳේ.

33 **අතිරේක කාඩ්පත්**

බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන නියමයන් හා කොන්දේසින් මත බැංකුව විසින් කාඩ්පත් සාමාජිකයාගේ පවුලේ සාමාජිකයන්ට සිය පූර්ණ අභිමතය පරිදි අතිරේක කාඩ්පත් පහසුකම ලබාදෙනු ඇත. කාඩ්පත් ගිණුම යටතේ අතිරේක කාඩ්පත් දරන්නකු/දරන්නන් සහ එය නිකුත් කරන ලෙසට බලය ලබාදෙන කාඩ්පත් සාමාජිකයා කාඩ්පත් භාවිතයෙන් කරන ලද වියදම් සියල්ලට එක්ව සහ වෙන් වෙන්ව වගකීමට බැඳේ. අතිරේක කාඩ්පත් පහසුකම ප්‍රාථමික කාඩ්පත් සාමාජිකයාගේ ඉදිරි පැවැත්ම අනුව තීරණය වේ.

34. **ගෙවීම් ප්‍රයෝජනයට ගැනීම**

කාඩ්පත් සාමාජිකයා සහ ඔහු වෙනුවෙන් බැංකුවට ලැබෙන සියළු ගෙවීම්, කාඩ්පත් සාමාජිකයා හෝ ගෙවීම් සිදුකරන වෙනත් පුද්ගලයකු විසින් පරිහරණය සඳහා ලබාදුන් යම් විශේෂිත උපදේශයක තිබුනේ වුවද, බැංකුව විසින් යෝග්‍ය යැයි සිතන ආකාරයට සහ ක්‍රමයට ප්‍රයෝජනයට හෝ පරිහරණයට ගනු ඇත.

**35.** <u>දුරකථන, අන්තර්ජාල, ටෙලක්ස්, ෆැක්ස් සහ විද්‍යුත් තැපැල් උපදෙස් සඳහා අවසර සහ හානි පූරණය.</u>

**35.1** කාඩ්පත් සාමාජිකයා හෝ ඔහු/ඇය වෙනුවෙන් දුරකථන, අන්තර්ජාල, ටෙලක්ස්, ෆැක්ස් සහ විද්‍යුත් තැපැල් මගින් කලින් කලට ලබාදෙනු ලබන හෝ ලබාදීමට අදහස් කරනු ලබන යම්කිසි දැනුම් දීමක්, උපදෙසක්, විධානයක් හෝ වෙනත් පණිවිඩ හුවමාරුවකදී, බැංකුව වෙතින් කිසිදු විමසීමක් නොකර සහ උපදෙස් ලබාදෙන හෝ ලබාදීමට අපේක්ෂා කරන තැනැත්තාගේ අධිකාරී බලය හෝ අනන්‍යතාවය සහ උපදෙස් ලද අවස්ථාවේ බලපැවැත්වුණ අවස්ථානුගත කරුණු සලකා බැලීමකින් තොරව යන කරුණු වලට අගති රහිතව විශ්වාස තැබීමටත් එයට අනුකූලව ක්‍රියා කිරීමටත් කාඩ්පත් සාමාජිකයා බැංකුවට බලය ලබාදේ. කාඩ්පත් සාමාජිකයා බැංකුව විසින් ලබාදෙන තීරණය උපදෙස් ලද දිනට අවසානාත්මක බව පිලිගනු ඇත.

**35.2** උපදෙස් කාඩ්පත් සාමාජිකයන්ගේ පූර්ණ බලය පිට වන බවටත්, ඒවායින් බැඳී සිටින බවට සැලකීමටත් බැංකුවට හිමිකම් ඇති අතර, ලබාදෙනු ලබන උපදෙස් මුදල් ගෙවීමට හෝ බැහැර කිරීමට හෝ යම් මුදලක් ලේඛනයක් පවරා දීමට අදාල වන හෝ කාඩ්පත් සාමාජිකයාට කිසියම් ගිවිසුමකට බැඳ තැබීමට හෝ බැංකුව සමග වෙනත් ගිවිසුමකට හෝ වෙනත් පුද්ගලයකු සමග ඇති ගිවිසුමකට හෝ කාඩ්පත් සාමාජිකයා කවර ආකාරයේ හෝ වෙනත් ගිවිසුමක හෝ එකගවීමට අදාල ගණුදෙනුවේ හෝ එකගතාවයේ ස්වභාවය හෝ සම්බන්ධිත මුදල පිළිබඳව සැලකීමෙන් තොරව උපදෙස් හි වන යම් දෝෂයක් සංදිග්ධතාවයක් හෝ වරද වටහා ගැනීමක් හෝ අපැහැදිලිතාවයක් නොතකා බැංකුව විසින් යෝග්‍ය යැයි සලකනු ලබන පියවර ගැනීමටත් ඒ කෙරෙහි විශ්වාසය තැබීමටත් බැංකුවට හිමිකම් ඇත.

**35.3** මෙම බලය පැවරීමේ සහ හානි පූරණය කිරීමේ නියමයන්ට අනුකූලව බැංකුව ක්‍රියා කරන විටදී, හෝ එම උපදෙස් සම්බන්ධයෙන් කුමන ආකාරයකින් බැංකුවට දැරීමට සිදුවන සහ උද්ගත වන සියලු පාඩු, හිමිකම්, නීති කෘතයයන්, කාර්යාවලීන්, විධානයන්, අලාභ, නඩු ගාස්තු සහ වියදම් වලට එරෙහිව බැංකුවට හානි පූරණය කිරීමට සහ කරනු ලැබීමට කාඩ්පත් සාමාජිකයා අවලංගු කල නොහැකි සේ භාරගනී.

**35.4** බලය ලබාදීමට සහ හානි පූරන කිරීමේ මෙම නියමයන් බැංකුව වෙත කාඩ්පත් සාමාජිකයාගේ අවසන් කිරීමේ දැන්වීම ලැබෙන තෙක් සහ ඒ සම්බන්ධයෙන් ක්‍රියා කිරීමට

සාධාරණ කාලයක් දක්වා ක්‍රියාවෙහි සහ බලපැවැත්වෙනු ඇත. එවැනි කාලය අවසන්වීමට පෙර මෙම නියමයන්ට සහ බලය පැවරීම මත කරන ලද යම් ක්‍රියාවන් කෙරෙහි වගකීමෙන් කාඩ්පත් සාමාජිකයා මුක්ත නොවේ.

**36.** <u>විවිධ</u>

**36.1** කාඩ්පත් සාමාජිකයා සම්බන්ධයෙන් අවශ්‍ය වන යම් වැඩිදුර තොරතුරු ලබාගැනීමට සිය සේවා යෝජකයාගේ හෝ වෙනත් මූලාශ්‍රයක් සම්බන්ධ කර ගැනීමට කාඩ්පත් සාමාජිකයා බැංකුවට මෙමගින් බලය ලබාදෙයි.

බිල්පතක් මත ගෙවිය යුතු මුදල ගැන දුරකථන මාර්ගයෙන් කාඩ්පත් සාමාජිකයාට සිහි කැඳවීමක් ලබාදීමට හෝ කාඩ්පත් සාමාජිකයා වෙනුවෙන් දුරකථන ඇමතුමක් ලබාගන්නා පුද්ගලයා වෙත සිහිකැඳවීමේ පණිවිඩයක් තැබීමට බැංකුවට හිමිකමක් ඇති බව කාඩ්පත් සාමාජිකයා එකග වේ. කාඩ්පත් සාමාජිකයාට ලිඛිතව හෝ වෙනත් ආකාරයෙන් කාඩ්පත මත ගෙවිය යුතු මුදල සම්බන්ධයෙන් සිහි කැඳවීමෙන් කුමන ආකාරයෙන් හෝ වගකීමක් බැංකුවට නොමැති අතර, බැංකුව විසින් ඉහත දක්වූ ආකාරයේ සිය මනාපය හෝ අයිතිය ක්‍රියාත්මක කිරීම ප්‍රශ්න කල නොහැක.

**36.2** කාඩ්පත් සාමාජිකයා මෙමගින් බැංකුවට කාඩ්පත් මත ගෙවිය යුතු කිසියම් හිග මුදලකට එරෙහිව සිය වත්කම් හෝ මුදල් තහනමට ගැනීමට සිය සමාගමට හෝ බැංකුවට ප්‍රවේශවීමටත් මේ සම්බන්ධයෙන් බැංකුව යෝගය යැයි සලකනු ලබන සියලු ක්‍රියාවන් කාර්‍යයන් සහ දෙවල්කිරීමටත් අවලංගු කල නොහැකි ආකාරයෙන් බලය ලබාදෙයි. මෙම **36.2** වගන්තිය මෙම ගිවිසුම අවසන් වන තෙක් පවතී.

**36.3** බැංකුවේ කිසිදු අයිතිවාසිකමක් බැංකුවේ ක්‍රියාවක් හෝ හැසිරීමක් මත හෝ එවැනි අයිතින් ක්‍රියාත්මක කිරීමෙහිලා වන කිසියම් ප්‍රමාද දෝෂයක් හෝ ප්‍රමාදයක් මගින් අතහැර දැම්මා සේ සැලකිය නොහැකි අතර, බැංකුව විසින් ලිඛිතව විශේෂයෙන් අතහැර දමන තෙක් සම්පූර්ණ බලපැවැත්වෙනු සහ ක්‍රියාවෙහි යොදනු ඇත.

**36.4** බැංකුවේ වරණය මත කිසියම් තෙවන පාර්ශවයකට කාඩ්පත් සාමාජිකයාගේ හිග හිටවා ඇති සහ අයවිය යුතුව ඇති යමක් හෝ සියල්ල විකිණීමට, පැවරීමට හෝ භාරදීමට බැංකුවට පූර්ණ හිමිකමක් සහ පූර්ණ බලයක් ඇති බව කාඩ්පත් සාමාජිකයා ප්‍රකාශිත පිළිගන්නා අතර ඒ සම්බන්ණයෙන් බැංකුව විසින් කාඩ්පත් සාමාජිකයාට ලිඛිතව දැනුම්දීම මගින් එවැනි තෙවන පාර්ශවිය කාඩ්පත් සාමාජිකයකු බැංකුවට වන එවැනි වගකීම පිළිගැනීමට කාඩ්පත් හිමියා බැඳී සිටී. මේ වෙනුවෙන් වන ගාස්තුවක් කාඩ්පත් සාමාජිකයාගේ ගිණුමෙන් අයකර ගනු ඇත.

**36.5** කාඩ්පත් සාමාජිකයාගේ ගිණුමෙයි යම් බැර ශේෂයක් වෙතොත් ඒ සම්බන්ධයෙන් පොලිය ගෙවීමේ කිසිදු වගකීමක් බැංකුව වෙතින් කිසිදු ආකාරයේ ඇති නොවන බවට වන කාරණය කාඩ්පත් සාමාජිකයා හඳුනාගනී.

**36.6** කාඩ්පත් සාමාජිකයාට ඔහුගේ/ඇයගේ කාඩ්පත් සාමාජිකත්වය මතම අනුග්‍රහක වැඩසටහන් වලට අදල වන වෙනත් නියමයන් හා කොන්දේසින් මගින් පාලනය වනු ඇත.

**36.7** සේවා සැපයුම් ආයතනය විසින් ඔවුන්ගේ වෙලඳ බඩු සේවාවන් සම්බන්ධයෙන් වට්ටම් ලබාදීමට හෝ මිල අඩුකිරීමක් සංවිධාන කරන හෝ පවත්වන විටදී කාඩ්පතට ගරු නොකරනු ඇත.

මෙම ගිවිසුම ඕනෑම අවස්ථාවකදී වෙනස් කිරීමට බැංකුවට අයිතිය ඇති අතර, එවැනි යම් වෙනසක් පිලිබඳව කාඩ්පත් සාමාජිකයාට දැනුම්දෙනු ඇත. සාමාජිකයා විසින් වෙනස් කිරීම පිලිබඳව දැනුම්දීම ලැබීමෙන් පසුව කාඩ්පත් තවදුරටත් තබාගන්නේ නම් හෝ භාවිතා කරන්නේ නම් කාඩ්පත් සාමාජිකයා විසින් වෙනස් කිරීම් පිළිගනු ලැබූ බවට බැංකුව සලකනු ලැබේ. කාඩ්පත් සාමාජිකයා විසින් වෙනස් කම් පිළිනොගත හොත්, කාඩ්පත් සාමාජිකයා විසින් කාඩ්පතෙහි චුම්බක තීරුව කැපී යන ආකාරයෙන් කොටස් හතරකට විකර්ණව කැපීමෙන් සහ කොටස් බැංකුවට භාරදීමෙන් කාඩ්පත් සාමාජිකයාට මෙම ගිවිසුම අවසන්කල හැකිය. එවැනි අවසන් කිරීමට පෙර කරන ලද සියලු ගාස්තු සහ වියදම් වලට කාඩ්පත් සාමාජිකයා තවදුරටත් වගකීමට බැඳෙන සහ වගකිව යුතු වේ.

**37.** <u>නීතිය සහ අධිකරණ පාත්‍රතාවය.</u>

මෙම ගිවිසුම ලංකාවේ නීතින්ට අනුකූලව බලපැවැත්වෙනු සහ අර්ථ විග්‍රහාකරනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුව හෝ වෙනත් ව්‍යවස්ථාපිත ඒකකයක් විස්න නිකුත් කරනු ලබන නීතියක්, රෙගුලාසියක් හෝ උපදේශක් මගින් සංශෝෂධනයක් අවශ්‍ය කරන විටකදී මෙම ගිවිසුමද ස්වයංක්‍රියව සංශෝධනයට පවතිනු ඇත. කාඩ්පත් සහ කාඩ්පත් ගිණුම වලංගු සහ නීත්‍යානුකූල අරමුණ සඳහා පමණක් භාවිතා කරනු ඇත. කාඩ්පත් හෝ කාඩ්පත් ගිණුම කාඩ්පත් හිමියා විසින් භාවිතා කරන්නේ නම් හෝ වෙනත් අයකුට භාවිතා කිරීමට ඉඩලබාදෙන්නේ නම් එවැනි භාවිතා කිරීමක් සම්බන්ධයෙන් කාඩ්පත් සාමාජිකයා වගකිව යුතු අතර එවැනි භාවිතයක ප්‍රතිඵලයක් වශයෙන් අලාභ සහ/හෝ පාඩු බැංකුවට හෝ ඇමරිකන් එක්ස්ප්‍රස් වෙත දරන්නට සිදුවූ සියලු අලාභ/වියදම් ප්‍රතිපූරණය කිරීමට අවශ්‍ය වේ.

**38** <u>පවරා දීමේ නියමයන්</u>

බැංකුව විසින් ඕනෑම ඇමරිකන් එක්ස්ප්‍රස් සමාගමටකට හෝ එහි ඕනෑම අනුබද්ධිත සමාගමකට හෝ තිලය ලබන්නෙකුට (ඕනෑම ඇමරිකන් එක්ස්ප්‍රස් ඒකකයකට මෙම ගිවිසුම සම්පූර්ණයෙන් හෝ ඉන් කොටසක් දැනට හා අනාගතයේ ඕනෑම අවස්ථාවකදී පවරා දිමට කාඩ්පත් සාමාජිකයා මෙමගින් කැමැත් ලබාදෙන අතර, එවැනි පවරාදිමක් බැංකුව විසින් හෝ ඕනෑම ඇමරිකන් එක්ස්ප්‍රස් කාඩ්පත් සාමාජිකයා වෙත ලබාදෙන පවරා දිමේ නොතිසියේ සඳහන් දිනයේ සිට ක්‍රියාත්මක වන ඇත.